# භූ විද්‍යාත්මක සිතියම් සහ පළාත්බද ඛණිජ සිතියම් මුද්‍රණය කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමේ ප්‍රසම්පාදන දැන්වීමයි

## භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
## පරිසර අමාත්‍යාංශය
## ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාවේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, භූ විද්‍යාත්මක සිතියම් සහ පළාත්බද ඛණිජ සිතියම් මුද්‍රණය කිරීම සඳහා හැකියාව ඇති සුදුසුකම් ලත් ආයතන හෝ සමාගම් වෙතින් හා දේශීය හෝ ජාත්‍යන්තර ටෙන්ඩර්කරුවන්ගේ දේශීය නියෝජිතයන් වෙතින් මිල ගණන් කැඳවනු ලැබේ.

ශ්‍රී ලංකාවේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රධාන කාර්යයක් වනුයේ රටෙහි විවිධ වර්ගයේ භූ විද්‍යා සිතියම් සකස් කොට ප්‍රකාශයට පත් කිරීම වේ.

භූ විද්‍යා සිතියම් ගත කිරීමේ සහ ඛණිජ සම්පත් ගවේශණයේ වැඩසටහන් යටතේ 1 : 50,000 පරිමාණයේ චාතුර්ථික සිතියම් 02 ක්, ඛණිජ සම්පත් සිතියම් 01ක්, භූ විද්‍යාත්මක සිතියම් 01ක් සහ පළාත්බද ඛනිජ සිතියම් 01ක් ආර්ක්මැප් (Arc map) මෘදුකාංගය භාවිතා කරමින් සකස් කොට ඇත.

මෙම ටෙන්ඩරයේ අරමුණ වනුයේ දැනට මුද්‍රණය කොට ඇති තත්වයේ හෝ ඊට උසස් තත්වයේ සිතියම් චතුර් වර්ණයෙන් ඕෆ්සෙට් මුද්‍රණයෙන් සකස් කිරීමට හැකියාව සහිත සුදුසුකම් ලත් ආයතනයක් හෝ සමාගමක් තෝරා ගැනීමයි.

ලංසුකරුවන් අවම වශයෙන් සෙ.මී. 70 x 103 හා උපරිම වශයෙන් සෙ.මී. 119 x 84 මුද්‍රණය කල හැකි ප්‍රමාණයේ පරාසයක, ඉතා ඉහල තත්වයේ චතුර්වර්ණ ඕෆ්සෙට් සිතියම් මුද්‍රණය කිරීමේ හැකියාවෙන් හා පලපුරුද්දෙන් විය යුතුය.

ලංසු ලේඛන හා සිතියම් නියදි පිටපත් www.gsmb.gov.lk වෙබ් අඩවිය වෙතින් බාගත කිරීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පිටකෝට්ටේ, එපිටමුල්ල පාරේ, අංක 569, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පළමු මහලේදී පරීක්ෂා කිරීම කල හැක. වැඩිදුර විස්තර භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ මිලදී ගැනීම් අංශයෙන් ලබා ගත හැක.

සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ලේඛන **2022.11.03** දින ප.ව.**2.00** ට ප්‍රථම පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ පිළිගැනීම් අංශයේ ඇති අදාළ ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ හැකිය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවර **"භූ විද්‍යාත්මක සිතියම් සහ පළාත්බද සිතියම් මුද්‍රණය කිරීම සඳහා මිල ගණන්"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**සභාපති**
**ප්‍රසම්පාදන කමිටුව**
**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය**
**නො.569**
**එපිටමුල්ල පාර**
**පිටකෝට්ටේ**